ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2013 දෙසැම්බර් 16 සඳුදා
06 වෙළුම - 07 කලඹ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 52/ News/ 2013

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



Photo By: Thilina Alahakoon CCP

## උතුරේ අසරණයන් හා නත්තල බෙදාගත්
# උදාර මෙහොතක් !

( නායකකන්ද මීසම් ජනතා උපහාරය - පිංතූර කථාව අවසන් පිටුවේ )

Lama Pradeepaya

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# දෙලොවක් අතරේ නත්තල් සමරනු බැහැ

## ආදරණීය දුවේ පුතේ...

2013 වසරේ ආගමන සමය අවසන් කරමින් දැන් අපි ''නත්තල්'' මහා මංගලෝත්සවය ආධ්‍යාත්මිකව හා සාමූහිකව සමරන්නට සූදනම් වෙනවා. මේ කාල වකවානුවේ නත්තල පිළිබඳව ආධ්‍යාත්මික නොවන විවිධාකාර කථා බාහිර සමාජයේ කථා වෙන බව අපට දැනෙනවා. ඒ වාගේම අපට හැඟෙනවා. නමුත් ආදර දුවේ පුතේ, නත්තලේ තිබෙන මිහිරියාව කතෝලික දරුවන් අත් විඳින්නේ කොහොමද කියලා බාහිර සමාජයට ජීවිතයෙන් පෙන්නුම් කර දෙන්න ඔබට සුවිශේෂී වග කීමක් පැවරීලා තිබෙනවා. ඒ ඔබ කතෝලික නිසා. ජේසු සමිඳුන්ව ජීවිතයෙන්ම අත්දකිමින් ඔබ ජීවිතය ක්‍රමිකව ධාර්මිකත්වය කරා ගොඩ නංවන නිසා. එහෙම බලන විට ආදර දුවේ පුතේ, අපි මේ ආගමන සමයේ මෙනෙහි කරන සුවිශේෂී පාඨයන් කරා වඩාත් ප්‍රබලව අපගේ සිත් කුඩා කාලයේ පටන්ම යොමු කළ යුතු වෙනවා.

මේ බලන්න, ආගමන සමයේ අපට පෙන්වන කිතුනු ගැඹුරු චින්තනය දිහා. කිතුනුවා ඉදිරියේ දේව රාජ්‍යය හා මිනිසාගේ රාජ්‍යය කියා රාජ්‍යයන් දෙකක් පවතිනවා. අද මෙය සාමාන්‍ය ධර්මතාවයක් බවට පත්වෙලා. දැන් ආගමන සමයේ මෙනෙහි කිරීම් තුළින් අපි එබී බලමු, මේ රාජ්‍යයන් දෙක විග්‍රහ කරන ආකාරය දිහා. මිනිසාගේ රාජ්‍යයේ රජ කරන්නේ අසාධාරණයයි. තමන්ගේ වාසි හා ලාභ තකා බලවතා විසින් දුබලයා තලන පෙලන න්‍යායක් එහි තිබෙනවා. දේව රාජ්‍යය මෙයට පටහැනියි. එහි තිබෙන සාධාරණ පැවැත්ම පිළිබඳව ආගමන සමයේ නිරන්තරයෙන්ම කථා කරනවා. එහි බලවතා විසින් දුබලයා සූරා කෑමක් නැහැ, සාමය, සමගිය, මෛත්‍රිය එහි රජ කරනවා. නත්තල් ප්‍රීතිය වෙනුවෙන් සූදනම් වන මේ වකවානුව තුළ අපගේ සාන්ත සභාව අපට සිහි කැඳවන්නේ ජේසු සමිඳුන්ගේ දෙවන පැමිණීම පිළිබඳවයි. එහිදී අපට අවශ්‍යයෙන්ම සිහිපත් කරවන්නේ ඇතුලාන්ත සූදනමක් හා සිත් හැරීමක් පිළිබඳවයි.

බලන්න ආදර දුවේ පුතේ, ඉසයියස් දිවැසිවරයා අපට පවසන දේ ''ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණවූ තැනැත්තෙක් අප අතරට වඩින සේක. උන්වහන්සේ ඇසින් දකින සැටිවත් කනින් ඇසෙන සැටිවත් විනිශ්චය නොකරයි. ධර්මිෂ්ඨ කතෙන් ඔහු විනිශ්චය කරයි. වැරදි තැනැත්තාට පහර ලැබෙයි. අධර්මිෂ්ඨයා පලවා හැර ශාන්තියේ හා මෛත්‍රියේ රාජ්‍යය ගොඩ නඟයි. ඒ නව රාජ්‍යයේදී වෛරයට හා ක්‍රෝධයට ඉඩක් නැත. සාමය සමගිය රජ වෙයි''.

ඒ වගේම ආදර දුවේ පුතේ, ශු. පාවුළු තුමාත් මේ ආගමන සමයේ අපට ගැඹුරු චින්තනයක් ඉදිරිපත් කරනවා. ''ක්‍රිස්තු සමිඳාණන් චර්මඡේදනය වූවනට මෙහෙ කරුවකු වූ සේක. එසේ කළේ අන්‍ය විශ්වාසිකයින්ද දෙවියන් වහන්සේ වෙත ගෙනවුත් උන්වහන්සේට ප්‍රශංසා ගැයීම සඳහාය. උන්වහන්සේ අන්‍ය ජාතිකයින්ද එක් කළ සේක. පැමිණෙන්නට තිබෙන රාජ්‍යයේ ජාති බේද හා කුල භේද කිසිත් නොමැත. එහෙයින් කිතු සමිඳුන් අපව එකම ජාතියක් වශයෙන් එකතු කර ඒ පැමිණෙන නව රාජ්‍යයට සූදනම් කරයි''.

බලන්න, ආදර දුවේ පුතේ, කතෝලික අපගේ ජීවිත පැවැත්ම කෙතරම් බලවත්ද කියලා. නත්තලේ පණිවිඩය කුඩා කාලයේ සිටම ජීවත් කරවන අපි එකම රාජ්‍යයක හිමි කරුවන් බවට පත්වෙනවා. ඒ සැබවින්ම සාමූහිකත්වයේ ප්‍රබල පුරුක් සේ අපිව දිස්වෙන නිසා. මේ නිසා කතෝලික අප ඉදිරියේ දිස් විය යුත්තේ දේව රාජ්‍යය පමණයි. අනෙක් සියළු රාජ ්‍යයන් මිනිසාව කැඳවාගෙන යන්නේ අසහනය කරා පමණයි. ජාතිවාදී නොවන, කුළ භේද නොතකන, අනුන් වෙනුවෙන් කැපවුනු ආදරය කරන ජීවිත රටාවක් කතෝලිකයාට උරුම බැවින් අන් සියළු දෙනාම අද කතෝලිකයා දිහා ඇස් දල්වා බලා සිටිනවා. කතෝලික පුංචි ඔබ දිහාත් බලාගෙන සිටිනවා. සංඛ්‍යාවෙන් අල්ප වුනත් ඒ සුලු සංඛ්‍යාව නියෝජනය කරන කතෝලික අප ප්‍රබලව මේ දේශයේ පුරුක් බවට පත් වී ඉන්නේ නත්තලේ ඒ ප්‍රබල ධර්මතාවය ජීවිතයෙන් පෙන්නුම් කරන නිසයි. ක්‍රිස්තුන් වහන්සේ හා සමඟ ඒ දේව රාජ්‍යය අප අතර දැන් තිබෙනවා. කතෝලිකයින් හැටියට අපි ඒ දේව රාජ්‍යයට බැඳී සිටිනවා.

එහෙම නම් දුවේ පුතේ, ඒ ප්‍රබල දේව රාජ්‍යයේ කොටස් කරුවන් හැටියට දෙලොවක් අතර සිට අපට නත්තල සමරන්න බැහැනේද? අපි මේ ගැන අවදිව නිරන්තරයෙන්ම මෙනෙහි කරන්නට මේ නත්තල් සමය උපයෝගි කර ගනිමු.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා




## පාපය

❖ ප්‍රඃ දෙවි පියාණන් අසතුටු කරන්නේ කුමක් ද?
උඃ පාපය යි.

❖ ප්‍රඃ පාපය නම් කුමක් ද?
උඃ දැනුම ඇතිව, කැමැත්තෙන් දේව පනත් කඩකිරීම ය.

❖ ප්‍රඃ සියලූ පව් දෙවි පියාණන් ඒකාකාරව අසතුටු කරයි ද?
උඃ නැත. මරණීය පවු වැඩි වශයෙන් ද සුළු පව් අඩු වශයෙන් ද උන්වහන්සේ අසතුටු කරයි

❖ ප්‍රඃ මරණීය පාපය නම් කුමක් ද?
උඃ සම්පූර්ණ තේරුම් ඇතුවද, මුළු කැමැත්තෙන් ද බරපතල කාරණාවක දී දේව පනත් කඩ කිරීම ය.

❖ ප්‍රඃ මරණීය පාපයෙන් ආත්මයට සිදු වන විපත් මොනවාද?
උඃ දේව ඉෂ්ට ප්‍රසාදය නැතිව නිරයට හිමි වීමය.

❖ ප්‍රඃ සුළු පව නම් කුමක් ද?
උඃ සුළු කාරණාවකදී හෝ මුළු කැමැත්ත හා තේරුමක් නැතිව බරපතල කාරණාවකදී හෝ දේව පනත් කඩ කිරීමය

❖ ප්‍රඃ සුළු පවෙන් ආත්මයට සිදු වන විපත් මොනවා ද?
උඃ දේව ප්‍රේමය දුර්වල වීමද, මරණීය පාපයට මඟ සැලැස්වීම ද ආත්මය ශුධිකාග්නි ස්ථානයට හිමි වීම ද යන මේවා ය.

❖ ප්‍රඃ ඔබේ ආත්මය පාපයෙන් නිදහස්ව තබා ගැනීමට කුමක් කළ යුතු ද?
උඃ නරක මිතුරන්ගෙන් ද පව් සිදුවන දේවලින් හා ස්ථාන වලින්ද වැළකී බොහෝ සේ යාච්ඤා කළ යුතුයි.

## යාච්ඤා කිරීම

❖ ප්‍රඃ ස්වර්ග රාජ්‍යයට පැමිණීමට දෙවි පියාණෝ අපට උදව් වන සේක් ද?
උඃ එසේය. උන්වහන්සේගේ වරප්‍රසාදයෙන් අපට උදව් වනසේක.

❖ ප්‍රඃ උන්වහන්සේගෙන් වරප්‍රසාද ලබා ගැනීමට කුමක් කළ යුතු ද?
උඃ උන්වහන්සේගෙන් ඒවා ඉල්ලා යාච්ඤා කළ යුතුයි.

❖ ප්‍රඃ යාච්ඤාව නම් කුමක් ද?
උඃ දෙවි පියාණන් ගෞරවයෙන් සිහි කරමින් උන්වහන්සේට සිතින් හෝ වදනින් හෝ කථා කිරීම ය.

❖ ප්‍රඃ විටින් විට යාච්ඤා වෙන්නට ඕනෑ ද?
උඃ එසේ ය. "නිතොරව යාච්ඤා වෙන්නට ඕනෑය"යි ජේසු ස්වාමිදරුවෝ වදාළ සේක.

❖ ප්‍රඃ විශේෂයෙන් යාච්ඤා වෙන්න ඕනෑ කොයි වේලාවලද?
උඃ උදේ හා සවස ද, භෝජනයෙන් පෙර හා පසුව ද, දුර්පරීක්ෂා හා වෙනත් අනතුරු පැමිණෙන විට ද විශේෂයෙන් යාච්ඤා වෙන්නට ඕනෑ ය.

❖ ප්‍රඃ යාච්ඤා අතරෙන් ඉතා හොඳ යාච්ඤාව කුමක් ද?
උඃ දෙවි පියාණන්ට කථා කිරීමට ජේසු ස්වාමි දරුවන් අපට ඉගැන්වූ "ස්වර්ගයෙහි වැඩ සිටින අපගේ පියාණනි" යන යාච්ඤාව යි.

❖ ප්‍රඃ දෙවි පියාණන් හා ජේසු ස්වාමිදරුවන්ට පසු අප විශේෂයෙන් යාච්ඤා කළ යුත්තේ කාට ද?
උඃ ජේසු ස්වාමිදරුවන්ගේ සහ අපගේ මෑණියන් වන දේව මාතාවන්ට ය.

❖ ප්‍රඃ දේව මාතාවන්ට ඉතා හොඳ යාච්ඤාව කුමක්ද?
උඃ දේව දූත ආචාරය හෙවත් නමෝ මරිය ය.

# ළමා අපිත් යහපත් ගතිගුණ ඇතිකර ගනිමු.




**නිමාලිගේ අම්මා පළමු වසරේ ළමයින්ට උගන්වන ගුරුවරියක්. එයාගේ පන්තියේ ළමයින්ට ඇය හරිම ආදරෙයි. ඒ වගේම ඇයට තිබුණේ පුදුම විදියට අනුන් ගැන උණුවන සිතක්. ඒ නිසා ඇයට හැකි හැම විටකම අන් අයට උපකාර කරන්න පෙළඹුනා.**



නිමාලිට වයස අවුරුදු දහය විතර කාලෙදි හැම සෙනසුරාදා උදේකම එයාගේ ගෙදර කුස්සිය පැත්තට එන ගැනු කෙනෙක් සිටියා. මේ ගැනු කෙනා පැන්සලක් වගේ හරිම හරි කෙට්ටුයි. බොහොම දිරාපත් වුණු සුදු වොයිල් සාරියකුයි , පරණ සුදු හැට්ටයකුයි තමයි හැමදාම වගේ ඇන්දේ. ඉතින් මේ ගැනු කෙනා එන්න ඉස්සර වෙලා නිමාලිගේ අම්මා කුස්සියේ තියන වට්ටියකට එක එක ද්‍රව්‍ය දානවා. ඒවා අතර, පොල් ගෙඩියක්, හාල් හුණ්ඩු දෙක තුනක් අල ටිකක්, රතුලූනු , ගම්මිරිස් , සීනි සහ තේ කොළ ටිකක් වශයෙන් ඇතුලත් කරනවා සමහර දවස් වලට වත්තෙන් කඩන මුරුංගා වගේ එළවලු ටිකකුත් වට්ටියට එක් කරනවා. මේ ගැනු කෙනා ආපුවාම කුස්සිය පැත්තේ එළියේ තියලා තියන බංකුවේ වාඩි වෙනවා. කිසිම කතාවක් නැතිව කවුරු හරි එයාව දකිනකම් ඔහේ ඉන්නවා. ආවා කියලා අඟවන්නේවත් නැහැ.

එයා මල්ලක් වශයෙන් ගෙනාවේ පරණ කොට්ට උරයක්. ඉතින් අම්මා අර එකතු කරපු බඩු ටික මේ කොට්ට උරයට දාන්නේ නිමාලි. අම්මා නිමාලිට පෙන්නල දීල තිබුණ ඉස්සෙල්ලම පොල් ගෙඩියයි, හාල් ටිකයි තමයි යටටම දාන්න ඕනි කියලා, නැත්නම් අනිත් බඩු තැලෙන නිසා. නිමාලිගේ ගෙදරට එහා පැත්තේ තිබුණා ශාන්ත අන්තෝනි මුණිඳුන්ට කැප කළ කුඩා පල්ලියක්. අම්මා එකතු කළ බඩු ටික කොට්ට උරයට දමා එය මේ ගැනු කෙනා අතට දුන්නාම නොවරදවාම ඇය ''ජේසු පිහිටයි'' කියලා කියනවා. ඊට පස්සේ එයා ඒ කොට්ට උර මල්ලත් තුරුලු කරගෙන පරිස්සමින් පාර පැනලා යනවා. පල්ලියට ගොස් ඒ උරය අල්තාරය ළඟ බිම තියලා සෑහෙන වේලාවක් යාච්ඤා කරනවා. ඊට පස්සේ තමයි එයා ඒකත් අරන් ගෙදර යන්නේ.

මේ ක්‍රියාවලිය නිමාලිට මතක ඇති කල් වුණා. ඉතින් දවසක් මේ ගැනු කෙනා ගැන කුතුහලයක් ආ දවසක නිමාලි අම්මගෙන් ඇහුවා අම්මා කොහොමද මෙයාව අඳුනා ගත්තේ කියලා.
ඉතින් අම්මා කීවා ඉස්කෝලේ ළමයෙක්ගෙ අම්මා කෙනෙක් කීවා බොහොම දුප්පත් ගැනු කෙනෙකුයි, පිරිමි කෙනෙකුයි එයාලගෙ ගෙවල් ළඟ ඉන්නවා, හරියට කන්න අඳින්නවත් නැති තරමට දුප්පත් කියලා. අම්මා තවත් විස්තර ඒ ළමයාගේ අම්මා ගෙන් දැනගෙන ඒ ගැනු කෙනාට පණිවිඩයක් ඇරලා තියනවා සෙනසුරාදා උදේට ඇවිත් අම්මාව හමුවන්න කියා. පළමුවන දවසේ අම්මාව හම්බ වෙන්න ආපුවම අම්මා විස්තර අහන කොට කියලා තියනවා එයාගේ මනුස්සයට හොඳටම සනීප නැහැයිලු . පපුව අමාරුවකින් පෙළෙනවලු. ඒ නිසා රස්සාවක් හොයා ගන්නවත් බැරිලු මේ ආදි වශයෙන් මහ විස්තර ගොඩක්.

නිමාලිගේ අම්මාගේ සිත හොඳටම උණු වෙලා කියලා තියෙනවා. සුමානෙකට සැරයක් සෙනසුරාදා උදේ වරුවේ එන්න. අපට තියන හැටියකට මම හාල් තුනපහ ටිකක් දෙන්නම් කියලා.මේ කතාව අහපුවාම නිමාලිගේ හිතත් උණු වුණා. තමුන්ගේ අම්මා කෙරෙහි අසීමිත ආදරයක් නිමාලිගේ සිතට නැගුනා.
මේ විස්තර කියා අවසන් වූ පසු අම්මා නිමාලිට මෙහෙම කිවුවා.

''පුතේ අපි කවුරුවත් සල්ලි මහ ගොඩවල් තියන ධනවත් අය නෙමෙයි. නමුත් දෙයියනේ කියලා අපිට කාල ඇඳල ඉන්න තියෙනවා. වේල් තුනක් කන්න බැරි අය අප අතර කොච්චර නම් ඉන්නවද? මගේ පුතාල ලොකු මහත් වෙච්ච කාලෙක වුනත් නැති බැරි කෙනෙක් ගැන දැනගත්තම හරි, දැක්කම හරි , අහක බලාගෙන යන්න පුරුදු වෙන්න එපා. අපි හැමෝම දෙවියන්ගේ දරුවෝ. ඒක නිසා ''පරහට දයාව'' කියන එක අපේ ජීවිත වලට බද්ධ කර ගන්න අපි පුංචි කාලේ ඉඳලම පුරුදු වෙන්න ඕනෑ.'' කියලා අම්මා ලොකු සුසුමක් හෙලුවා.

අම්මා නිමාලිව ලංකර ගෙන ඇයගේ හිස අතගෑවා. ''පුතේ , තවත් දෙයක් හොඳට මතක තියා ගන්න ඕනෑ. ඒක තමයි, අපි දකුණතින් කරන දෙය වම් අතට නොදැනෙන්න කරන්නත් වග බලා ගන්න ඕනෑ. ඒ කියන්නේ පුතේ අපි කෙනෙකුට උදව්වක් කළාම ඒ ගැන අනිත් අයට කියා පාන්න යන්න හොඳ නැහැ. අපි කරන පරිත්‍යාග අපි බොහොම නිශ්ශබ්දව කරන්න ඕනෑ. අපි කරන දේ ජේසුට පේනවා. ලෝකේ අනිත් මිනිස්සු දැන නොගත්තට කමක් නැහැ.''

අම්මා කියූ දෙය ගැන නිමාලි නිතරම සිතන්න පටන් ගත්තා. ඇය පුදුම වුණා අපේ අම්මාට කොයි තරම් මොළොක් හදවතක් ද තියෙන්නේ මෙහෙම අසරණ අයගේ දුක් ගැන සිතලා ඒ අයට උදව් වෙන්න කියලා. නිමාලි හිතාගත්තා මගේ අම්මා වගේම මමත් ලොකු වුනාම අන් අයට හැකි පමණ උදව් උපකාර කරන්න මහන්සි ගන්නවා කියලා.

**ෆ්‍රීඩා විල්ලවරායන්**
**ටොරොන්ටෝ - කැනඩාව**

# මේ හෙල්දි ලංකා ඔවදන පුංචි ඔබටයි

කිතු සමිඳාණන්ගේ අසිරිමත් උපත සමරණ නත්තල උදාවනතුරු ඔබ සැම දින ගනිමින් සිටින බව නොරහසක්. නත්තලේදී තෑගි , ඇඳුම් පැළඳුම්, වඩාත් කැමති කෑම බීම පමණක් නොව නෑදෑ නිවෙස් වෙත යෑමටත්, යහළුවන් සමඟ සෙල්ලම් කිරීමටත්, රූපවාහිනී බැලීමටත් නිදහස ලැබෙන අතරම නත්තල් සාද , නත්තල් ගස් සැරසීම, ගවලෙන් සකස් කිරීම , කැරොල් ගීත ගායනය, ගෙවල් සැරසීම ආදී දරුවන්ගේ සිත් දිනාගත් අංගයන් බොහොමයක් ගෙන් නත්තල සමන්විතයි. ඒ නිසා සෑම කිතුනු දරුවකුටම නත්තල් හරිම විශේෂිතයි. නත්තල ලොකු කුඩා භේදයකින් තොරවම සැමටම ගෙන එන්නේ ලොකු සතුටක් චීත් ඒ සතුටු දිනයේත් ඔබ සැමටම තමන් බලාපොරොත්තු වන සතුට එලෙසම ලැබෙන්නේ නැහැ. නේද? ඇතැම් නත්තල් සාද වලදී ඔබ දකින අසන ඇතැම් දේවල් වලින් ඔබේ පුංචි මනසට සිදු විය හැකි බලපෑමත් සුළුපටු වන්නේ නැහැ. විශේෂයෙන්ම ඇතැම් ස්ථානයන්හිදී මද්‍යසාර භාවිතය පිළිබඳව ඔබට වැරදි ආකල්පයක් ගොඩනැගෙ න්න පුළුවන්. ඒ නිසාම නත්තල එළඹෙනතුරු බලාසිටින ඔබ මද්‍යසාර පිළිබඳ අදහස් ඇතිකර නොගෙන නිවැරදි දැනුම සහ අවබෝධයක් ලබා ගැනීමටත් මෙන්ම එම අවබෝධය සහ දැනුම ඔබේ යහළුවන්ට ලබා දීමත් හරිම වැදගත්.

ඇතැම් වැඩිහිටියන් මද්‍යසාර භාවිත කර නත්තලේ සතුට තමනුත් නැති කරගෙන අනිත් අයවත් නැතිකරවන අවස්ථාවන් ඔයාලා ඕනතරම් දැකලා ඇති. මද්‍යසාර භාවිත කර මත්වී , කෑ ගසමින්, වමනේ කරමින් මද්‍යසාර භාවිත කළ පුද්ගලයන් දුක් විඳිනවා පමණක් නොව පවුලේ අයගේ සතුටත් නැති කරවනවා. ඉතිං දරුවනේ ඇත්තටම මද්‍යසාර වලින් මොනවද ලැබෙන්නේ කියලා අපි බලමු. මද්‍යසාර වලින් ඇත්තටම සතුටක් ලැබෙන්නේම නැහැ. මද්‍යසාර වලින් සතුටක් ලැබෙනවා කියන එක බොරු කථාවක්. මද්‍යසාර වලින් දිවට, උගුරට, බඩට , ඔළුවට සහ ඇඟට ලැබෙන්නේ දුකක් , පීඩාවක් විතරමයි. කෙටියෙන් කිවහොත් මෙයින් ලැබෙන්නේ ඇගේ අමාරුවක් විතරමයි. මද්‍යසාර භාවිත කරන හැමෝම මේ අමාරුව විඳිනවා. චීත් එයාලට මේකේ අනිත් අයට කියාගන්න වත් බැරි එක ඊටත් වඩා කනගාටුදායකයි. මොකද එයාලා හැමෝම මේක සතුටක් කියලා පෙන්වන බොරු වෙස් මුහුණක් දාගෙනයි ඉන්නේ. මද්‍යසාර භාවිත වන මේසයක සිටින පුද්ගලයන් අනිත් අයට තව බොන්න කිය කියා බලකරන්නේ ඇයි? එමගින් තමන්ට බොන්න සිදුවන ප්‍රමාණය අඩු කරගන්න පුළුවන් වන හෙයින්. එලෙසම වැඩියෙන් මද්‍යසාර භාවිත කළ විට අමාරුව වැඩි වන අතර අඩුවෙන් මද්‍යසාර භාවිත කළ විට අමාරුව අඩුවන බව එයාලා හොඳින්ම දන්නා කරුණක් වන නිසා. මද්‍යසාර භාවිතයට පෙර සැවොම හිනාවෙලා හරිම සතුටින් ඉන්න බව ඔයාලා හොඳින්ම දකින දෙයක්. චීත් මද්‍යසාර භාවිත කර අවසන් වූ පසුව ඒ සතුට ඔවුන් තුළ දැක ගත නොහැක. සතුටින් තිබූ මුහුණු කළුවෙලා, මැලවෙලා,හරිම අමාරු , විරූපී , විසුළු පෙනුමක් ඇති වෙලා. සාදයේ තිබෙන සතුට එයාලට අහිමි වීම පමණක් නොව ඒ දෙස බලා සිටින ඔයාලගේ සතුටත් මෙයින් අඩු වෙනවා. එපමණක්ද නොව මද්‍යසාර භාවිත කළ පුද්ගලයන් අනෙකුත් අයගේ උසුළු විසුළු වලට භාජනය වන අතරම මේ හරහා තම පෞරුෂත්වය හීනකර ගන්නවා. මෙන්න මේවා තමයි මද්‍යසාර භාවිතයේ ප්‍රතිඵලයන්.

''මුද්‍රික පානයෙන් මත් නොවන්න. එයින් අනාචාරකම් හට ගන්නේය. ඒ වෙනුවට ආත්මයාණන්ගෙන් පූර්ණ වන්න.'' (එපීස 5.18) ලෙස දෙවිපියාණන් වහන්සේ වදාරන සේක. මද්‍යසාර භාවිත කර අනවශ්‍ය විහිළු කිරීමට මෙන්ම අසභ්‍ය වචන භාවිත කිරීමත් සිදු කරන බව ඔබ දැක ඇති. ඒයට හේතු වනුයේ මද්‍යසාර භාවිත කර සිදු කරනු ලබන අකටයුතුකම් සඳහා සමාව ලැබෙන බව ඒ පුද්ගලයන් විසින් දැන සිටීමයි. ඒ මනුස්සයා බීලානේ ඒ නිසා බනින්නේ නැතුව ඉවසගෙන සිටින ලෙස පවසා වෙනත් පුද්ගලයන් විසින් සමාව දීම කරනු ලබයි. නමුත් මද්‍යසාර භාවිත කරන පුද්ගලයන් විසින් එම ක්‍රියාවන් හොඳින්ම දැන කරනු ලබන බව ඔබ හොඳින්ම තේරුම් ගත යුතුයි. මද්‍යසාර භාවිත කරන දුබලයන් ඉදිරියේ චන්ඩීන් වන ඔවුන්ම ප්‍රබලයන් ඉදිරියේ බයාදු වන්නේ එහෙයිනි. මද්‍යසාර භාවිත කර සිදුකරන්නේ බොරු රඟපෑමක් බව අවබෝධ කරගෙන එම නොමනා ක්‍රියාකාරකම් හෙළි කරන්න. මේ පිළිබඳව ඔබේ අවට ප්‍රජාවත් දැනුවත් කරන්න.

මද්‍යසාර පිළිබඳව දෙව් පියාණන් වහන්සේ මෙසේ වදාරණ සේක. ''බීමත්කම සුරා උත්සව සහ එවැනි තවත් දේ කරන්නට දෙවියන් වහන්සේගේ රාජ්‍යයෙහි උරුම නොවන්නේය.'' (ගලාති 5:21) මේ නත්තලේදී මද්‍යසාර පිළිබඳව නිවැරදි අවබෝධයකින් යුතුව බැලීමටත් මෙන්ම ඔබේ යහළුවන්ට. මේ නිවැරදි අවබෝධය ලබා දීමටත් උත්සහ ගන්න. මන්ද ඔබේ මිතුරන්ට මෙම අවබෝධය ලබා දීම සැබෑම මිතුරෙක් ලෙස ඔබගේ වගකීමක්ද වන අතර එසේ නොවුනහොත් අනාගතයේදී ඔවුන් මද්‍යසාර වලට ගොදුරු වන්න පුළුවන්. නත්තලට මද්‍යසාර ගෙන සාද පැවැත්වීම දෙව් පියාණන්ගේ දේව වචනයට අනුකූල නොවන බව දැන් ඔබට මනාව වැටහෙනවා ඇති. නත්තලේදී අපිව පාපයෙන් ගලවා ගැනීමට කුරුසිය කර දරාගත් කිතු සමිඳාණන්ගේ බැහැපත් දරුවන් බවට පත් වෙමු. මෙවර නත්තල මද්‍යසාරයෙන් නිදහස් කර ගැනීම සඳහා මෙන්ම කිතුනුවන් මද්‍යසාරයෙන් නිදහස් කර ගැනීම සඳහාද අවශ්‍ය පියවර ගන්න. මද්‍යසාර වලින් තොරව සැබෑම සතුටින් නත්තල ගත කරන අයුරු ඔබගේ පවුලේ වැඩිහිටියන් සමඟ සාකච්ඡා කරන්න. යහළුවන්ටත් මේ දැනුම ලබා දෙන්න. සැබෑ දේව දරුවන් ලෙස දෙවියන් වහන්සේගේ ප්‍රේමයට පෙරලා ප්‍රේම කරන්න. අපිව පාපයෙන් ගලවා ගැනීමට කුරුසිය කර දරාගත් කිතු සමිඳාණන්ගේ උපත භක්තියෙන් බැහැපත් කමින් සමරන්න. ඔබ සැමට ප්‍රීතිමත් නත්තලක් වේවා.

**චතුරිකා සඳපානි - (හෙල්දි ලංකා)**



වැලිවේරිය සාන්ත අන්තෝනි දහම් පාසලේ ළමුන් 101 ක් පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. දේව මෙහෙය ගරු ජෝන් කැමිලස් , ගරු රන්දිල් ප්‍රනාන්දු (නි.ම.නි) පියතුමන්ලාගේ සහභාගිත්වයෙන් පැවැත්වුණි.

දිව්‍ය පූජාවෙන් අනතුරුව මීසම් සේවක ගරු ලක්ප්‍රිය නෝනිස් සහයක ගරු ලලිත් තිසේරා පියතුමන්ලා ආරාධිත ගරු පියතුමන්ලා ළමුන් පුහුණු කළ ගරු පැවිදි සොයුරිය, දහම් පාසල් විදුහල්පතිතුමා හා ආචාර්ය මණ්ඩලය සමඟ ඡායාරූපයකට පෙනී සිටි අයුරු. **නිලානි පීරිස්**






සීදුව සාන්ත මරියා දහම් පාසලේ ළමෝ 42 ක් පසුගියදා සීදුව සාන්ත මරියා දෙව් මැදුරේදි ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. දේව මෙහෙයෙන් අනතුරුව ළමුන් සීදුව මීසම් සේවක ගරු ඇන්ටන් ප්‍රේමලාල්, සහයක ගරු ටිරෝන් අජිත්, ගරු ජෝන් හෙට්ටිආරච්චි යන පියතුමන්ලා, ගරු පැවිදි සොයුරිය දහම් ගුරුවරියන් සමූහ ඡායාරූපයකට එක්වූ අවස්ථාවක්.

**රන්ජිත් ලොකුපෝතාගම**



දියලගොඩ මීසමේ දරු දැරියෝ 56 ක් පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමා ගරු මේරි ජුලියට් පැවිදි සොහොයුරිය සහ දහම් පාසලේ ගුරුවරියන් ළමුන් සමඟ සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු. **ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

# ක්‍රිස්තියානි ඉතිහාසයේ අසිරිය 36

## රෙපරමාදු ආභාෂයෙන් බිහි වෙන නව චින්තන රටා

පසුගිය ලිපිය හා සබැඳේ

### ජැන්සෙනිස්ත වාදය

ප්‍රංශයේ බොහෝ කතෝලිකයෝ ජැන්සෙනිස්තවාදී අදහස්වලට බර වූ නමුත් කතෝලික නායකයෝ එය හැම විටම සැලකුවේ සභා සම්මතය නොලත් මිත්‍යා මතයක් සේ ය. ක්‍රි.ව. 1653 දී පාප් තුමා ජැන්සෙනිස්ත වාදයේ ආරම්භකයා සේ සැලකුණු ජැන්සෙන්ගේ ලිපි ලේඛනවලින්ද කරුණු පහක් උපුටා ගෙන ඒවා ධර්ම විරෝධියැයි කියමින් ඒවා පිළිගැනීම කතෝලිකයන්ට තහනම් කළහ. ජැන්සෙනිස්තවරු උපක්‍රමශීලීව පාප් තුමන් විසින් සඳහන් කරන ලද මත ධර්ම විරෝධී බව තමන්ද පිළිගන්නා බව ප්‍රකාශ කළහ.
එහෙත් ඒ සමගම එවැනි අදහස් ජැන්සන්ගේ ලිපි ලේඛනවල දක්නට නොමැතියැයි ද ප්‍රකාශ කළහ. විවාදය දිගටම බලපැවතුණේය.



එය අවසන් වූයේ ජැන්සනිස්තවරු තමන්ට විරුද්ධව කුමන්ත්‍රණය කරනවා යැයි යන චෝදනාව මත 14 වෙනි ලුවී රජතුමා ඔවුන්ට විරුද්ධව දරදඬු ක්‍රියා මාර්ගයක් ගැනීමට තීරණය කිරීමත් සමග ය. ඔහු ''පෝට් රෝයල්'' කන්‍යාරාමය වසා දැම්මේ ය. කන්‍යා සොයුරියන් වෙනත් තැන්වලට යවා ගොඩනැගිලි බිමටම සමතලා කර දැමී ය. මධ්‍යස්ථානයකින් ක්‍රියාත්මක වූ ජැන්සෙනිස්ත වාදය එලෙස අවසන් වූ නමුත් චින්තන රටාවක් වශයෙන් එය නැවතුනේ නැත. එහි ආභාෂය දිගටම පැතුරුණේය. ආගම එක්තරා දොම්නසකින් යුතුවද , ප්‍රීති ප්‍රමෝදයෙන් තොරව ද ගත කළ යුතු ජීවිත ක්‍රමයක් යන අශුභවාදි චින්තනය ප්‍රංශ ක්‍රිස්තියානිය තුළ දිගටම පැවතෙන්න විය. ප්‍රංශ ධර්ම දූතවරුන් විසින් ලාංකික කතෝලිකයන්ට හඳුන්වා දෙන ලද ක්‍රිස්තියානියේද එම අඳුරු චින්තනයේ ලකුණු දක්නට ලැබෙනවා යැයි සමහරුන් පවසති.

ජැන්සෙනිස්තවාදීන් මර්දනය කිරීමට 14 වෙනි ලුවී රජ යොදා ගත් දඩබ්බර ක්‍රියාවලිය ප්‍රංශයේ ආගමික ප්‍රශ්න විසඳීමට ඔහු සාමාන්‍යයෙන් යොදාගත් ක්‍රියා මාර්ග තේරුම් ගැනීමට ද ප්‍රයෝජනවත්ය . ආගම අතින් වාදාවිවාදයට හෝ විවේචනයට තුඩු දෙන කිසිවක් ඔහු පැවසුවේ නැත. ඔහුගේ පාලනයට සුළුවෙන් හෝ තර්ජනයක් විය හැකි කිසිවකට ඔහු ඉඩ හැරියේ නැත.

ප්‍රංශයේ රෙපරමාදු සභාවක් වූ ''හියුගොනොට්වරු'' ඔහු කෙතරම් කෲර විලාශයකට මර්දනය කළාද කිවහොත් ඔහුගේ පීඩාවලින් මිදීමට ඔවුන්ට රට හැර එංගලන්තයට හෝ අයර්ලන්තයට යෑමට සිදු විය. ඔහු කතෝලික සභාව පාලනය කෙළේ රජයේම ආයතනයක් හෝ දෙපාර්තමේන්තුවක් සේය. රදගුරුවරුන් හා පැවිදි නායකයන් පත් කළේ ඔහුම ය. කිසිම අනුකම්පාවක් නැතිව ඔහුගේ යුද්ධ හා ගොඩනැගිලි සඳහා රටවැසියන් ගෙන් අයබදු අයකෙළේ ය. තමන් සඳහා කථා කිරීමට විසෙන්ති පෝල් වැන්නෙක් නැතිව ගැමි ජනයා අන්ත අසරණ තත්ත්වයකට පත් වූහ. 14 වෙනි ලුවීගේ රාජ්‍ය පාලනය ගාම්භීර එකක් වූ බව ඇත්ත ය. එහෙත් අනික් පැත්තෙන් එය සාමාන්‍ය ජනයා අන්ත අසරණකම්වලින් පෙලුණු යුගයක් ද විය. රටේ එක්සත්කම රැකුණා නම් ඒ ඔහුගේ දැඩි ඒකාධිපති පාලනය නිසා මය.

යුරෝපයේ බොහෝ රජවරු ඔහුව ආදර්ශයට ගත්තේ නිරායාසයෙන්ම ය. ඔහුගේ මාලිගාවල ගාම්භීරත්වය සේම රටවැසියන් හා ක්‍රිස්තියානි සභාව ඔහු පාලනය කළ විලාශයද ඔවුන්ගේ අනුකරණයට ලක්විය. 18 වෙනි ශත වර්ෂයේ යුරෝපය ආඥාදායක කෲර රජවරුන් ගෙන් ගහණ යුගයක් විය. තමන්ගේ ලොකුකම ගැන බොරු හැඟීමක් හා පුහු ආටෝපයක් හැර එතරම් බුද්ධිමත් භාවයක් ඔවුන්ට තිබුණේ නැත.

### 11 එංගලන්තයේ පියුරිටානු වාදය

ප්‍රංශය තුළ ජැන්සෙනිස්ත වාදයෙන් සිදු වූ දේ එංගලන්තය තුළ සිදු වූයේ පියුරිටානු වාදය තුළින් ය. දෙකම රෙපරමාදු ආභාෂය මත සම්ප්‍රදායානුකූල සභා තුළ ඇති වූ නව චින්තන රටාවේ ජැන්සෙනිස්ත වාදය කතෝලික සභාව තුළ බිහි විය. පියුරිටානුවාදය එංගලන්ත සභාව තුළ බිහි විය. දෙකටම මුල් වූයේද එකම ආකල්පයකි. එනම් යමෙක් තම මහා පව් බරින් මිදී මරණින් පසුව සුරලොව යෑමට නම් මෙලොවදී හැම මට්ටමකම සැප සම්පත් ඔහු අත්හළ යුතුයැයි යන්න ය. දෙකම සභා නායකයින් විසින් අසම්මත සේ ගනු ලැබුණේ ය. රාජ්‍ය පාලකයින්ගේ විරෝධයද දෙකටම එකසේ ලැබුණේ ය.

ඉදිරියට .......

**සංස්කාරක පියතුමන් විසිනි**

# යහපත් ගතිගුණ වඩමින් ජේසුගේ ආදරය ලබමු

**"එදා අපේ ගමේ පල්ලියෙ දිව්‍ය පූජාව තිබුනෙ සවස් කාලයක ඊට පෙර තමයි දහම් පාසල පැවැත්වුනේ. දිව්‍ය පූජාවට ගිය මා ලඟට මගේ චූටිපුතා දුවගෙන ආවේ ඇස්දෙකේ කඳුළු පුරෝගෙන පුතාගේ වෙනස මට එයාව දුටු ගමන්ම තේරුම් ගත්තා".**

"ඇයි පුතේ මේ " මම පුතාගෙන් දෙවරක් නොසිතාම ඇසුවා. "අනේ අම්මී බලන්නකෝ මගේ බෑග් එක නැතිවෙලානෙ". "ඇයි පුතේ එහෙම වෙන්නෙ කොහොමද ඒක තිබුනෙ ඔයාගෙ ලග නෙවෙයිද?" "මා ලඟ තමයි අම්මේ තිබුනෙ ඒත් මට සිස්ටර් එන්න කියලා තිබුණ නිසා මම පොත් බෑග් එක මම ඉඳගෙන උන්න බංකුව උඩම තියලා සිස්ටර් ලගට ගියා. ඒ ගිහින් එද්දි දහම් පාසල් පංතිය ඉවරවෙලා අපි හිටපු තැන කවුරුත් නැහැ. අපි ඉඳගෙන හිටපු බංකුවත් නැහැ. බංකුව උඩ මම තියලා ගිය බෑග් එකත් නෑ." චූටි පුතා වේදනාවෙන් පිරුණ දෙනෙතින් යුතුව ගැහෙන හඬින් එක හුස්මට ඒ සිදුවීම මා සමඟ පැවසුවා.

"ඉතිං පුතේ ඔයා ඔයාගේ ලඟ ඉඳගෙන උන්න යාළුවන්ගෙන්වත් ඇහැව්වෙ නැද්ද බෑග් එක කෝ කියලා" "ඇහැව්වා ඒත් එයාල දන්නෙ නෑ කිව්වා" චූටි පුතා තවදුරටත් වේදනාවෙන්ම කිව්වා ඊට පස්සෙ මටත් ඕනෑ උනා පුතාගෙ බෑග් එකට මොකද වුනේ කියලා හොයන්න.

මම පුතාට දහම් පාඩම් කියලා දෙන එයාලගෙ ගුරුතුමියට මේ ගැන කිව්වා ඇය කිව්වා "අතන තමයි අද දහම් පාඩම කියලා දුන්නෙ එතන බිමවත් තියෙනවද කියලා බලන්න" කියලා මම පුතත් සමඟම එතනට ගියා ඇත්ත තමයි පුතා බෑග්එක තියපු බංකුවත් එයත් එක්ක එකම බංකුවේ ඉඳගෙන දහම් පාඩම ඉගෙන ගත්ත යාලුවොවත් නැති ඒ තණ බිස්සේ තැන් තැන්වල පැළවෙලා තිබුණු වල් පැළෑටි උඩ බෑග් එක තිබුණා. ජේසු ගැන ඉගෙන ගත්ත ජේසුගෙ ආදරය , කරුණාව , බැහැපත්කම, ගැන අකුරුකරපු දරුවෝ අතින්ම නේද මේ පොත් බෑගය ගිලිහුනේ කියලා මට හිතුනා. මට ඕන වුනා ඒ මොහොතෙම මගේ පුතාගේ ගතිපැවතුම් වුනත් මේ වගේමදැයි එයාගෙන්ම දැනගන්න. ඒ නිසාම මම පුතාගෙන් මෙහෙම ඇසුවා. ඔයාගේ යාලුවෙකුගේ පොත් බෑග් එකක් ඔයවගේ තියලා ගියොත් ඔයා මොකද කරන්නේ" කියලා.

පුතා මට පිළිතුරු දුන්නෙ එයාගෙම අත්දැකීමකින්මයි. දවසක් දහම්පාසලේදී මගේ පංතියේ මා ලඟ හිටපු යාළුවෙකුට "ටොයිලට් එකට යන්න ඕනවෙලා බෑග් එක තියලා එයා ගියා. එද පාඩම ඉවරවෙලා අපි පල්ලිය ඇතුලට යන කල්ම එයා ආවේ නැහැ. මම එයාගෙ පොත් බෑග් එකත් අරගෙනගිහින් පල්ලිය ඇතුලෙන් තියලා එයා ඇවිත් ඒක හොයද්දි මම ඔයාගේ බෑග්එක අරගෙන ආවා කියලා මම බෑග් එක එයාගේ අතට දුන්නා.

"ඔයා කොයිතරම් හොඳද චූටි පුතේ" මම කිව්වෙ වේදනාවට ඇස්වලින් මතුවුන කඳුළු බිඳු වෙනුවට සතුටට ඇස්වලට උනපු සතුටු කඳුළු සමඟින්. ආදරණිය දුවේ පුතේ මවක ලෙස මා ලැබූ මෙම සත්‍ය අත්දැකීම පුංචි දෙයක් වුවත් ජේසු ගැන අකුරු කරන , ජේසුගේ යහපත් ගති අගය කරන අපි උන්වහන්සේ වගේම අපි අපට මෙන්ම අන් අයටත් අන් අයගේ වටිනාකම්වලටත් ආදරය දක්වන්නට උනන්දු විය යුතුයි.

**සමන්ති සිල්වා - උඩයන්දළුව (කන්ජුක්කුලිය මීසම)**

---

## ළමා ඔබ නත්තල සැමරීමට සූදනම්ද?

**නත්තල ලග එනබව මට දැනුනේ ඒ සීතල සුළගේ මිහිරියාවත් සමගයි. අප නත්තල සමරනුයේ නිවැරදි ලෙසද? එය දිගින් දිගටම මෙනෙහි කරගෙන යන විට මට මෙම සමාජ මට්ටම පිළිබඳ දැනුනු අදහස් අකුරු කරමි. "සිතා බලන්න මාගේ සිතතුළ ඇති මෙවන් දෙගිඩියාවක් ඔබ හදවතටත් දැනුනාද කියලා.**

විවිධ විලාසිතා වලින් යුත් ඇඳුම් පැළඳුම් උත්සව පැවැත්වීම් , විශාල නත්තල් ගස් සහ ගවලෙන සෑදීම ආදියට වැඩි උනන්දුවක් දැක්වීම. ගේ දොර නවී කරණය වීම නිතර කිතුනුවන් ඉරුදින දිව්‍ය පූජාවට සහභාගී නොවුනත් දෙසැම්බර් 24 වන දින රාත්‍රියේ නත්තල් දේව මෙහෙයට සහභාගී වෙති. පෙර නොදිටු විශාල පිරිසක් පල්ලියේ පිරෙනුයේ එදිනටය. සෑම අයෙකුම විවිධ මෝස්තර වලින් සැරසී එකිනෙකා අභිබවා යාමට වෑයම් දරති. පූජාවේ හරය සිතට ගන්නේ කීයෙන් කී දෙනාද?

**ජේසු කුමරු මෙලොවට බිහිවූයේ ඇයි?**

**දේවත්වය අතහැර මනුෂ්‍යත්වය ගෙන මෙලොවට පැමිණීමෙන් පසු මිනිස් ජීවිත ගණනාවක් වෙනසකට භාජනය විය. ලෙඩුන් සුවකරමින් , පව්කරුවන් හරිමාර්ගයට ගනිමින් සමාජයෙන් කොන්වූ අය සමග ජීවත්වූ ජේසුස් වහන්සේ ශ්‍රේෂ්ඨයකු බව අපි කවුරුත් දනිමු. නමුත් මහලොකුවට එතුමන්ගේ මග යන බව ප්‍රකාශ කරමින් ලෝකවාසීන් වූ අප ඊට ප්‍රතිවිරුද්ධ දේම කරති. බාහිරව නත්තලට සූදානම් වීම දෙවිඳුන්ට අප කරන උපහාරයකි. නමුත් උන්වහන්සේ අපෙන් බලාපොරොත්තු වන්නේ අභ්‍යන්තර ජීවිත වෙනසකි.**

අතීතයේ දිනක ශු. නිකුලා මුනිතුමා (නත්තල් සීයා) දුප්පත් අයවෙනුවෙන් තෑගි බෝග තිළින කළා. අද එතුමාගේ නාමය රූපවාහිනියේ හා අන්තර්ජාලය තුළ සෙල්ලම් භාණ්ඩයක් වී ඇත. ගරුකළ යුත්තන්ට නිසි ගරුත්වය ලබාදී බෙදාගැනීම තුළින් නත්තල සැමරීම කිතුනු ඔබගේත් මගේත් පරම යුතුකමකි.

**ශාන්‍යා රොෂේනි ප්‍රනාන්දු - 10 ශ්‍රේණිය**
**ආවේ මරියා කන්‍යාරාමය - බෝලවලාන**

# දේව අම්මා

**කතෝලික අපට මරියතුමිය හුදෙක් ක්‍රිස්තුන් වහන්සේගේ මව පමණක් නොවේ එතුමිය සාන්ත භාවය කරා පියමනින සාන්ත සභාවේත් , දුර්වල සැදැහැවත් අපගේත් ආලෝකයයි. ශක්තියයි, ආදර්ශයයි.**

එතුමිය ගැලවුම්කරුවාණන්ගේ මව වීමට දෙවියන් වහන්සේ විසින් සුවිශේෂ ලෙස තෝරා ගත් සේක. ගාබ්‍රියෙල් අග්‍රදූතයා ඒ පිළිබඳව එතුමියට දැනුම් දුන් අවස්ථාවේදී ''මේ මම ස්වාමීන් වහන්සේගේ දාසිය වෙමි. ඔබ කී ලෙස මට සිදු වේවා'' කියමින් එතුමිය දේව කැමැත්තට මුළුමනින්ම හිස නැමූසේක. ජේසුස් වහන්සේ මිනිස් පුතකු මෙන් රැකබලා ගැනීමේ වගකීම් එතුමියටත් ශු. ජුසේ තුමාටත් පැවරුනි. ජේසුස් වහන්සේද තම ජීවිත කාලය තුළදී ඔවුනට කීකරුව හා ගරු බිය ඇතිව ජීවත් විය. එදා කානා නුවර වතුර මිදි රසට හැරවීමේදී තම ප්‍රථම ප්‍රාතිහාර්යය ජේසුස් වහන්සේ සිදු කලේද මරිය තුමියගේ ඉල්ලීම පරිදිය. කුරුස ගමනේදී ද දේව මැණියන් දේව කැමැත්ත අනුසාර කරමින් ජේසුස් වහන්සේ සමඟ ගමන් ගත් සේක. දේව මැණියන්ගේ බැහැපත් කම සහ කීකරු කම අගයමින් දෙවිඳුන්ට අපිත් ලං විය යුතුයි.



දිව්‍ය සත්ප්‍රසාදීය ජීවිතයක උත්තම ආදර්ශය මරියතුමිය යැයි කීම අතිශයෝක්තියක් නොවන්නේය. ඒ මන්දයත් දිව්‍ය සත්ප්‍රසාදීය ජීවිතය යනු දේව කැමැත්තට මුල් තැන දෙමින් දේව කැමැත්ත සොයමින් හා එය පිළිපදිමින් ජීවත් වීමයි. නිර්මල මරිය තුමිය තම ජීවිත කාලය පුරාම සිදු කළේ ද එයමය. බැහැපත්කම , නිහතමානිකම, හා බෙදා ගැනීම තුළ එතුමිය දේව කැමැත්ත අනුසාර කළසේක. වර්තමානයේ ඇතැම් සෙසු කිතුනු බැතිමතුන් විසින් මරිය තුමිය සම්බන්ධයෙන් දරන දුර්මත හමුවේ වුවද එතුමිය මහ පවුරක් මෙන් ශු. සභාව සුරකිමින් සමාජික සමාජිකාවන් වන අප දිව්‍ය සත්ප්‍රසාද ජීවිතයකට කැඳවන සේක. එතුමියගේ එම ක්‍රියාවන් අනුගමනය කරමින් අපත් දෙවිඳුන් පැසසිය යුතුයි.

දේව මැණියන්ගේ පහස ලබමින් ජීවත් වීමට නම් ඔබගේ මගේ ප්‍රතිචාරය විය යුත්තේ කුමක්ද? නිරන්තර යෙන් ජපමාලය උච්චාරණය කරමින් මරිය තුමිය මෙන් දිව්‍ය සත්ප්‍රසාදීය ජීවිතයක් ගත කිරීමට වරම් ඉල්ලා සිටිමු. මේ ගමනේදී බාධක කම්කටොලු, ගැටලු ඉදිරියේ වැටෙන හා පසුබට වන අප සියල්ලෝ ඒ සැම මොහොතකම මරියාවන් දෙසට හැරෙමු. එතුමියගේ ආදරය, ශක්තිය හා ආලෝකය එක සිතින් ප්‍රාර්ථනා කරමු.

**ඉවංකා අමාෂිනි**
**09 ශ්‍රේණිය**
**සාන්ත අන්තෝනි දහම් පාසල - දුනකදෙණිය**

# මට හරි ආසයි

දෙව්මවුනේ මටත් ආසයි
ඔබෙ හදටම තුරුළු වෙන්න
ඔබේ ජීවිත ආදර්ශයන්
මගේ ජීවිතයට අරන්
යහපත් කිතු දරුවකු ලෙස
මගේ දිවිය ගත කරන්න
මට හරි ආසයි



**ෂෙහාරා ලක්ෂාණී - 08 ශ්‍රේණිය**
**උත්ථානවූ කිතු සමිඳුන්ගේ දහම් පාසල**
**දංකොටුව - (ගොඩැල්ල මීසම )**

## දළුපත දහම් පාසල් උත්සවය...

දළුපත සා. අන්තෝනි දහම් පාසලේ වාර්ෂික උත්සවය 2013 දෙසැම්බර්16 (පෝය දින) ප.ව. 1.30 ට දෙව්මැදුරු භූමියේදී පැවැත්වේ. මෙදින ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී වනුයේ ළමා ප්‍රදීපය සභය සංස්කාරක දේශක කුමර නයනජිත් මහතාය. ගරු පියතුමන්ලාගේ මග පෙන්වීම යටතේ ආචාර්ය මඩුල්ල එක්ව මෙහි කටයුතු සංවිධානය කෙරේ.

**ප්‍රගීත් ශිරෝමන් - විදුහල්පති**
**සා. අන්තෝනි දහම් පාසල - දළුපත**

# මාසික සිතිවිල්ල





**මාසික**
**සිතිවිල්ල**

''දෙසැම්බර් මාසය''
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

**සේයා**
**ටෝනි නිශාන්ත ප්‍රනාන්දු**

**ළමා ප්‍රදීපය නත්තල් කලාපය ලබන සතියේ .......**



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

**පාඩම් අංක : 121**

## අපි ඉංග්‍රීසි භාෂාවේ වැදගත්ම වචනයක් වන **have** පිළිබඳ ඉගෙන ගනිමු

5. අපිට **have/has** යෙදෙන තවත් අවස්ථාවක් වෙන් කොට හඳුනාගත හැකියි. යමක් සිදුවෙනවා, යමකට මූණපානවා, යම් සිදුවීමකට යටත් වෙනවා, වැනි අදහස් ප්‍රකාශ කිරීමේදීත් සමහර විට **have / has** යෙදෙනවා.

She had a baby. had කියන්නෙ has/have වල අතීත පදය බව ඔබ දන්නවනෙ) (ෂී හැඩ් අ බේබි) මින් අදහස් කරන්නේ ඇයට දරුවකු ලැබුණා. දරුවකු ප්‍රසූත කළා කියන අදහස.

She had a car කිව්වනං ඒකෙන් අදහස් වෙන්නෙ ඇයට කාරෙකක් තිබුණා. (දැන් නැහැ) කියන එකයි. ඒක අපි ඉහත සඳහන් කළ "අයිතිවාසිකම" ගැන කීම සඳහා have / has / had යොදන අවස්ථාවක්.

නමුත් මෙහිදී She had a baby කිව්වනම් ඒකෙන් අදහස් වෙන්නෙ ඇයට දරුවෙක් හිටියා දැන් නැහැ කියන එක නෙවේ. ඒක තේරුමක් නැති අදහසක්.

මෙයින් මේ 5 වැනියට සඳහන් කළ යෙදීම අනුව අදහස් වෙන්නෙ ඇය දරුවකු ප්‍රසූත කළ බවයි.

Dilan had a flat tyre.
(ඩිලාන් හැඩ් අ ෆ්ලැට් ටය(ර්)

මේකෙන් අදහස් වෙන්නෙ ඩිලාන්ගෙ වාහනේ පැච් එකක් ගියා කියන එකයි. ඔහුට හුලං ගිය රෝදයක් තිබුණා කියන අදහස නොවේ. රෝදයේ හුලං යෑමේ සිද්ධියට මූණපෑමට සිදුවූ බවයි කියැවෙන්නෙ.

I had a bad dream.
(අයි හැඩ් අ බෑඩ් ඩ්‍රීම්)

මේකෙන් කියන්නෙ මම නරක හීනයක් දැක්කා. ඒ අත්දැකීමට අත් විඳින්න සිදුවුණා කියන අදහස.

දැන් පැහැදිලියි නේද?

have/has/had කියන එක මේ ඉහත සඳහන් හැම අදහසක්ම ප්‍රකාශ කිරීමට භාවිතා වන නිසා සමහර විට මේ ගැන හරි අවබෝධයක් නැත්නම් නිවැරදි අදහස කියවා තේරුම් ගැනීමටත් ලිවීමටත් අපහසු විය හැකියි.

ඒ නිසා මේ have/has විවිධ අවස්ථාවන් වලදී භාවිතා කෙරෙන හැටි හොඳින් අවබෝධ කරගන්න.

නැවත ඔබේ පහසුව පිණිස have / has යෙදෙන විවිධ අවස්ථාවන් පහතින් සඳහන් කරන්නම්. (නිදසුන් සමඟ)

1. අයිතිය හැඟවීම - I **have a car.**

2. කළ යුතු දෙයක් ගැන කීම - She has **to go to the market.**

3. සහකාර පදයක් (auxiliary) ලෙස - Henry **has gone** to Kandy

4. "භුක්ති විඳීම" කියන අදහස - They are **having a party** today.

5. අත්දැකීමක් / සිදුවීමක් වැනි අදහසක් ප්‍රකාශ කිරීමේදී
He **had a feeling** of lonliness.

### ★ have / has / had පිළිබඳව මේ කරුණත් මතක තබාගන්න.



ක්‍රියාවකට ing යොදලා භාවිතා කරන්නේ ක්‍රියාවක් පිළිබිඹුවන ක්‍රියා පදවලට පමණයි. (Action Verbs)

drink + ing = drinking
sleep + ing = sleeping .....යනාදි වශයෙන්

සාමාන්‍යයෙන්
believe + ing = believing
know + ing = knowing වගේ, ක්‍රියාවක් පිළිබිඹු නොවන (state verbs) ක්‍රියා පදවලට ing යොදා සාමාන්‍යයෙන් භාවිතා කෙරෙන් නෑ.

ඒ අනුව have + ing = having යෙදෙන්නෙ ඉහත සඳහන් 4 වැනි "භුක්ති විඳින" අදහස සමඟ විතරයි.

They are having a nice time (enjoying)
He is having his lunch (eating lunch)
They are having tea (drinking tea)

නමුත් සමහරු අයිතිවාසිකම ගැන කීමට has යොදද්දිත් ing යොදනවා. ඒක නිවැරදි නැහැ.

# දුෂ්කර වැල්ලවායෙන් පරිත්‍යාගශීලී මීසමකට ආරාධනා!

අපි වැල්ලවාය ශා. මරියා දහම් පාසලේ දරු දැරියන් වෙමු. කටුක දේශගුණයෙන් මෙන්ම විවිධ ආර්ථික අපහසුතා වලින් පීඩා විඳින අතලොස්සක් වූ කතෝලික පවුල් වල දරු දැරියන් 30 ක ගෙන් සමන්විත අප කුඩා දහම් පාසල දුෂ්කරතා මැද වුවද ඉතා සාර්ථක ලෙස පවත්වාගෙන යනු ලබන්නේ මීසම් සේවක ගරු ඇන්තනී හේමන්ත පීරිස් පියතුමාගේත් , සුරදූතික කන්‍යාරාමයේ ගරු පැවිදි සොහොයුරියන්ගේත් ගුරු මහත්මීන්ගේ හා දෙමාපියන්ගේ මහත් කැපවීම මතය.

වල් අලීන්ගේ ග්‍රහණයට හසුව ඇති ඈත ගම් දනව් වල සිට පා ගමනින් පැමිණෙන සමහර දරුවන්හට බස් ගාස්තුව සපයන්නේද බොහෝ විට උදෑසන ආහාරය පවා නොමැතිව එන අප හට සෑම ඉරුදිනකම කිරි වීදුරුවක් හා බනිස් ලබා දෙන්නේද පියතුමන් හා පැවිදි සොහොයුරියන් විසිනි. අනුග්‍රාහක භවතුන්ගේ සහාය ලබා ගෙන මෙම කටයුතු කරන අතර විවිධ ආර්ථික අපහසුකම් ඇති දරුවන් කිහිප දෙනෙකුට පා පැදි ලබා දීමටද කටයුතු කර ඇත.

නමුත් මේ සියළු බාධක මැඩ පවත්වාගෙන දහම් අධ්‍යාපනය මෙන්ම ආගමික වැඩ සටහන් විවිධ වැඩමුළු, විවිධ තරග, දෙමාපිය වන්දනා , පා ගමන් , එළිමහන් කඳවුරු, වැඩිහිටි සත්කාර, ඕගන් වාදන පුහුණුව , පුවත්පත් ලේඛන කටයුතු ඇතුළු සියළු අංශ වලින් අපව පෝෂණය කිරීමට පියතුමන් ඇතුළු පිරිස පියවර ගෙන ඇත.

අප යන මේ ගමනේදී අප හට ඇති විශාලම බාධකය වන්නේ ආර්ථික අපහසුතාවය යි. වැඩි පිරිසක් ජීවත් වන්නේ ගොවිතැන මතයි. එබැවින් අප දහම් පාසලේ දරුවන් කොළඹ ඇතුළු ප්‍රධාන නගර මෙන්ම අධ්‍යාපනික හා සංස්කෘතික වශයෙන් නැරඹිය යුතුම ස්ථාන පවා පියවි ඇසින් නොදුටු අයට මෙම පියතුමන්ට හැකි අයුරින් අප හට විවිධ චාරිකා අවස්ථා ලබා දෙන නමුත් අප නොදුටු ස්ථාන බොහෝය.

එබැවින් අප ඉල්ලා සිටින්නේ තවත් මීසමක දහම් පාසල් දරු දැරියන් හා එක්ව ඔවුන්ගේ අත්දැකීම් බෙදා ගනිමින් එකමුතු කම හා මිතු දම වර්ධනය කර ගැනීමටත් ඒ සමගම වැදගත් ආගමික ස්ථාන කිහිපයක් නැරඹීමටත් අප වෙත අවස්ථාව ලබා දෙන ලෙසයි. ඔබ කරනා මහඟු පරිත්‍යාග යක් ලෙස සලකා මෙම කටයුත්තට දායක වන ලෙස ඉල්ලීමක් ද කරමි.

**නිර්මාණි දිසානායක**
**9 ශ්‍රේණිය**
**ශා. මරියා දහම් පාසල වැල්ලවාය.**

## කොටිකාවත්ත දහම් ළමුන්ට ලේඛක වැඩමුළුවක්.



ළමුන්ගේ ලේඛක හැකියාවන් ඔප්නංවාලීමේ අරමුණින් පැවති ළමා ලේඛක වැඩමුළුවක් පසුගියදා කොලොන්නාව මීසමට අයත් කොටිකාවත්ත අවිලාහි සා. තෙරේසා දහම් පාසල් ළමුන් සඳහා එම දෙව්මැදුරේදී පැවැත්වුණි. මෙය මෙහෙයවනු ලැබුවේ කුමර නයනජිත් මහතා විසිනි. කොළොන්නාව මීසම් සේවක ගරු ජූඩ් ක්‍රිෂාන්ත පියතුමාගේ මඟ පෙන්වීම යටතේ දහම් ගුරු වරුන්ගේ සහයෝගයෙන් ප්‍රදීපය ලේඛක ආර්. ජෝශප් ප්‍රිය මහතා සම්බන්ධීකරණයෙන් මෙය සංවිධානය කෙරිනි. **ලූඩ්ස් ප්‍රියංකා - (ආචාර්ය මඩුල්ල - කොටිකාවත්ත)**

## කොටහේන සාන්ත බෙනදික්ත විදුහල් සාහිත්‍ය දිනය

කොටහේන සාන්ත බෙනදික්ත විදුහලේ ''සිංහ සාහිත්‍ය උදානය'' වාර්ෂික මහා කලා මංගල්‍යය, පසුගියදා ප්‍රවීණ සංගීතවේදී විශාරද සුනිල් එදිරිසිංහ සූරීන්ගේ ප්‍රධානත්වයෙන් විදුහල් ශාලාවේදී පැවැත්වුණි. මෙදින විශේෂ ආරාධිතයාණන් වූයේ විශ්‍රාමික සිංහල ආචාරිනී, මංගලිකා කෝරාළ ගුරු මහත්මිය යි. සාහිත්‍ය උළෙල ගායන, වාදන, නර්තන සහ නාට්‍ය විශේෂාංග රැසකින් විචිත්‍රවත් වුණි. සිංහල භාෂා හා සාහිත්‍ය වාර්ෂික තරගාවලියේ දී දක්ෂතා ප්‍රකට කළ සිසුන් ට සම්මාන , ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය සිදු කෙරිනි. **අශේන් එස් සේනාරත්න**





**නිරුක්ෂි ශේෂානි**

09 ශ්‍රේණිය

ශාන්ත රීටා දහම් පාසල

මා එළිය

**දිව්‍යාංජලී නවෝදා**

05 ශ්‍රේණිය

ශා. මරියා දහම් පාසල - හාල්දඩුවන





**ට්‍රොවෝන් ශෙනන් රිංස්ලි**

06 ශ්‍රේණිය

මාරිස්ටෙල්ලා විදුහල - මීගමුව




**රෝෂන් සංදීප ප්‍රනාන්දු**

07 ශ්‍රේණිය

සදාසරණ මාතා දහම් පාසල

රඹේපිටිය (කන්ජුක්කුලිය මීසම)



**ලකිත් තාරුක සිල්වා**

ජේසු බිළිඳු දහම් පාසල

කලමුල්ල





**නිමාෂා රුවිශානි**

06 ශ්‍රේණිය

සද සරණ දහම් පාසල

පරකඩුව

# ශු. ජුවාම් අපෝස්තුළුතුමා

සුදුවර චරිත

**ගලීලයේ වැසියෙකු වූ මෙතුමා සෙබදිලේ සහ මරිය සලෝමිගේ පුත්‍රයෙකි. මහා ජාකොබ් තුමාගේ සහෝදර යෙකි. මුල් කාලයේදී ජෝර්දාන් නදිය අසල දේශනා කළ ස්නාවක ජුවාම්තුමාගේ ගෝලයෙකි. නව ගිවිසුම තුළ ''ප්‍රේමවන්ත ශ්‍රාවකයා'' යන ආදර බර නාම යෙන් මෙතුමන්ව හැඳින්වූ බව ශු. සභා සම්ප්‍රදායේ එන ඉගැන්වීමකි. අන්තිම රාත්‍රි භෝජනය අවස්ථාවේදී ඔවුන්වහන්සේගේ ළයට හාන්සි වී සිටියේ මේ ශ්‍රාවකයා බව ශු. ලියවිල්ලේ සඳහන්වේ**




මෙතුමා ඔවුන්වහන්සේගේ අනුගාමිකයන් වුයේ සිය පියා සමඟ මසුන් අල්ලමින් සිටියදි බව (ගලීල මුහුදේදී) ශු. මතෙව් තුමා ප්‍රකාශ කර සිටියි. (මතෙව් 4/21) තවද සෙසු ගෝලයන් 11 ගෙන් මෙතුමා බෙහෙවින්ම ජේසුස් වහන්සේට ලැදි ව සිටි එකම එක තැනැත්තාය. තවද ජේසුස් වහන්සේද මෙතුමා කෙරේ දක්වාලුයේ අපරිමිත සෙනෙහසකි. මන්ද මෙතුමා පමණක් අවිවාහක තැනැත්තෙක් වූ නිසාවෙනි. ගෝලයින් දොළොස් දෙනා අතරින් විශේෂයෙන් තෝරාගත් ගෝලයන් තිදෙනා වුයේ ''පේදුරු, ජාකොබ් හා මෙතුමාය. ''ජුවාම්තුමාව හා ජාකොබ්තුමාව ශු. ලියවිල්ල තුළ ''ගර්ජනාවේ පුත්‍රයෝ ''ලෙස හඳුන්වා ඇත. (මාක් 3/17) ස්වකීය ගැලවීමේ ක්‍රියාදාමය තුළ පාස්කු භෝජනය පිළියෙළ කිරීමට යවන්නේද මෙතුමන්වය. (ලුක් 22/8) ජේසුස් වහන්සේ ගැලවීමේ ක්‍රියාදාමය සාක්ෂාත් කළ අවස්ථාවේදී එනම් කුරුසියේ එල්ලී සිටියදී සිය මෑණියන්ද තමා ප්‍රේමකළ ශ්‍රාවකයා ද ළඟ සිටිනු දැක, ''ස්ත්‍රිය මෙන්න ඔබේ පුත්‍රයා ....'' යැයි සිය මෑණියන් හට වදාළ සේක.

ඉන්පසු උන්වහන්සේ එම ශ්‍රාවකයාට කතා කොට ''මෙන්න ඔබේ මෑණියෝයැයි වදාළ සේක. ඒ මොහොතේ සිට ඒ ශ්‍රාවකයා තම නිවසට ඇය පිළිගත්තේය. (ජොහාන් 19/20 - 27) මෙහිදි ප්‍රේමවන්ත ශ්‍රාවකයා යන ව්‍යවහාරයෙන් අමතන්නේ ජොහාන්තුමාවය. උත්ථාන වූ ස්වාමින් වහන්සේගේ උත්ථානයේ සාක්ෂියක් මෙතුමා ලද අතර පේදුරුතුමා හා මෙතුමා හිස්ව තිබෙන සොහොන් ගෙය දුටු බවද ශු. ලියවිල්ලේ සඳහන් වේ. (ජුවාම්20/4-10) පෙන්තකොස්ත දිනයෙන් පසු දේවමාලිගාවේ ''සුදර්ශන'' දොරටුව අසල සිටි කොර සිඟන්නා සුවකරන්නේද? පේදුරුතුමා හා මෙතුමන්ය. සිය ධර්මදූතික මෙහෙවර තුළ සුළු ආසියාව තම මූලස්ථානය කර ගත් මෙතුමා සිරකරුවකු ලෙස රෝමයට ගෙන ගිය අතර මරණ අදහසින් උණු තෙල් කටාරමකට දැමු බවත් ඉන් මෙතුමා නිරුපද්‍රිතව වූ නිසා පැට්මොස් දිවයිනට පිටුවහල් කළ බවත් සඳහන් වේ.

ශු. සුවිශේෂ තුළ ''ජොහාන්'' සුභාරංචිය රචනා කරන්නේ මෙතුමා විසිනි. එය රචනා කරන්නේ ඔවුන් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් වසර 63 කට පසුවය. එය ග්‍රීක භාෂාවෙන් ලියා ඇති අතර එහි තේමාව වුයේ ජේසුස් වහන්සේ දේවපුත්‍රයාණන් බවත් ඔවුන් වහන්සේ ඇදහීමෙන් ජීවනය ලැබෙන බවත්ය. තවද නවගිවිසුමේ අවසාන ග්‍රන්ථය වන එළිදරව්ව ග්‍රන්ථය මෙතුමා විසින් රචනා කරන ලද්දක් ලෙස සැලකෙන අතර නව ගිවිසුමේ පොදු ලිපි තුනක් ද මෙතුමා විසින් රචනා කර ඇත. පසුව මෙතුමා එපිස නගරයට ගිය අතර ක්‍රි.ව. 100 දී ස්වභාවික මරණයක් ලබාගත් බව සඳහන් වේ. එතුමාගේ මංගල්‍යය දෙසැම්බර් 27 වනදා සමරනු

**අසේල දසනායක විසිනි**



## ප්‍රහේළිකා අංක 42

### හරහට

1. මංගලම් කීමට පැමිණි ගාබ්‍රියෙල් දේවදූතයාට මරිය තුමිය පැවසූවේ ''බලන්න, මා ස්වාමින් වහන්සේගේ ......................... වෙමි. ඔබ පැවසූ ලෙස මට සිදුවේවා'' යි යනුවෙනි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

3. .................. නොවරද්දා ගැනීමට පරිස්සම් වන්න. නැතිනම් ඔබ ගැන සෝදිසියෙන් සිටින්නාට ඔබ අසුවන්නට පුළුවන් යනුවෙන් උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

4. මරියතුමියගේ උදන ගීතයේ මෙසේ සඳහන් වේ. ''සමිඳුන්'' මහා නරපතීන් සිය සිහසුන් වලින් ...................... හෙලා දීනයන් ඉහල නංවා උසස් කළ සේක.. මෙහි හිස්තැනට සුදුසු වචනය.

6. ක්‍රිස්තුන් වහන්සේ සුව කළ ලාදුරු රෝගීන් දස දෙනාගෙන් උන්වහන්සේ ට ස්තුති කරන්නට නැවත නොපැමිණි සංඛ්‍යාව.

8. මෙහි ඉඩකඩ නොමැති වූයෙන් ජේසුතුමාගේ උපත සිදුවුයේ ගවලෙනකය.

### පහළට

1. මරියතුමියව දේවමාතාවන් ලෙස තෝරා ගන්නා විට එතුමිය ........... රජ පරපුරෙන් පැවත එන ජුසේතුමා හට විවාහ ගිවිසුම් දී සිටියාය. මෙහි හිස්තැනට සුදුසු වචනය.

2. මරියතුමියගේ උදන ගීතයේ මෙසේ සඳහන් වේ. ''සමිඳාණන් සාගිනි වූවන් .................. දෙයින් සතප්වා ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ස්නාවක ජුවාම් තුමා තම එක් දේශනයකදී මෙසේ ප්‍රකාශ කළේය ............. හොඳ හැටි පිරිසිදු කරන පිණිසත්, ධාන්‍ය තෙලා සිය අටුවෙහි රැස් කරන පිණිසත් ක්‍රිස්තුන් වහන්සේ අතෙහි කුල්ල ඇත. හිස්තැනට සුදුසු වචනය.

5. මරියතුමිය තම කුළුදුල් පුත්‍රයාව බිහිකොට රෙදිවලින් .................... ගව ඔරුවක සැතපුවාය. මෙහි හිස්තැනට සුදුසු වචනය.

6. ස්නාවක ජුවාම් තුමා ඉපදෙන විට සකරියස්තුමා ගොළුව සිටි බැවින් තම පුත්‍රයාට දිය යුතු .................. ගල්ලෑල්ලක ලියා පෙන් වූ බව ශු. බයිබලයේ සඳහන් වේ හිස් තැනට සුදුසු වචනය

7. ''කිසිවෙකු පහනක් දල්වා බඳුනකින් වසන්නේවත් යහනක් යට තබන්නේවත් නැත ඇතුළු වන්නන්ට එළිය ගෙනෙන පිණිස පහන් රුක උඩ තබති. '' ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

(මෙම ප්‍රහේළිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. ලූක් 1,2,3,4, 17,19,8/16 උපදේශකයා හෙවත් සිරාක් 28/13 )

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා** - කිරිමැටියාගාර

# මග්ගොන සා. මරියා විදුහලෙන් නත්තල් ගී ප්‍රසංගයක්....



මග්ගොන සාන්ත මරියා විද්‍යාලයේ දූ පුතුන් එකතුව උදවන නත්තල නිමිත්තෙන් ''ගව මඩුවේ කවි මඩුව'' ගරු ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමන්ගේ හා ගරු මර්සලින් ජයකොඩි පියතුමන්ගේ කවි ගී ඇසුරින් නිර්මාණය කරන ලද, නත්තල් කාව්‍ය ඉගිනළුව සහ ගීයක ආගමනය, නත්තල් ගී ප්‍රසංගය, ප්‍රවීන ගායන ශිල්පී, අයිවෝ ඩෙනිස් ශූරීන්ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා මග්ගොන මර්සලින් ජයකොඩි පිය සමරු ශාලාවේදී පැවැත්වුනි.

මීට එක්වූ අයිවෝ ඩෙනිස් ශූරීන්ට ගරු. මර්සලින් ජයකොඩි පිය උපහාර තිළින පිදීම මග්ගොන මීසම් සේවක ගරු ඉෂාන් ප්‍රමීන, ගරු මේරියස් ප්‍රනාන්දු (නි.ම.නි.) පියතුමන්ලා සමග බර්ට්‍රම් ප්‍රනාන්දු මහතා විසින් සිදුකරන ලදි. සාන්ත මරියා විදුහලේ විදුහල්පති, අජන්ත චානක මහතා ඇතුළු ආචාර්ය මණ්ඩලයේ සහයෝගයෙන් හා විද්‍යාලීය ආදිසිසු සංගමයේ අනුග්‍රහයෙන් මෙය සංවිධානය කෙරෙනි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ. **ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**


ශුද්ධවූ බයිබලය ඇසුරෙන්..
මෝසෙස්
32
චිත්‍ර කථා රචනය: ආනන්ද කාලිංදේරා
දෙබස් හා චිත්‍ර:- ඩබ්ලිව්.ඒ.පී. සනත් ආරච්චි
රජතුමා අපට මෙතරම් බරපතල වැඩ පැවරුවේ මෝසෙස් හා ආරොන් නිසයි. ඔවුන් අපව වහල් බවෙන් නිදහස් කර ගන්වා කීවා.. කෝ කෝ..? යමු ගිහින්.. ඔවුන්ට දෙකක් කථා කරන්න...
මාළිගාවෙන් පිටවී ආ ඔවුන්...
මෝසෙස්... රජතුමා අපට මෙතරම් බරපතල වැඩ පැවරුවේ නුඹ.. ආ පසුයි.... නුඹ අපව වහල් බවෙන් නිදහස් කරගන්නවා කියා.. රජු හමුවී මොනවද කළේ...?
...අපව නිදහස් කර ගන්නවාද.. නෑ.... දැන් රජතුමා කෝපවී අපට තවත් දුෂ්කර වැඩ පැවරුවා. මෝසෙස්, ආරොන් නුඹලා.. නිසා තමයි මේ හැමදේම වුණේ. මේ වාට නුඹලාට දෙවියන්ගෙන් දඬුවම් ලැබෙයි....
එහිදී හෙබ්‍රෙව් නායකයන්ට මෝසෙස් ..කථා කර......
හෙබ්‍රෙව්වරුනි මේ ඇසාපල්ලා.. අප ස්වාමිවූ දෙවියන් වහන්සේට.. සියලු බලය ඇත... උන්වහන්සේ නිරතුරුවම.. නුඹලාව ඊජිප්තුවේ වහල් භාවයෙන් නිදහස් කරගන්ට කැපවී සිටී
උන්වහන්සේ, අප දෙදෙනා මෙහි එවූයේ එවැනි උන්වහන්සේ නුඹලාව. අනිවාර්යයෙන්ම.. නිදහස් කරගනු ඇත.
මෝසෙස් හා ආරොන් නැවත.. පාරාවෝ හමුවෙති......
මහ රජතුමණි.. දෙවියන් වහන්සේගේ සෙනඟ වන අප ජාතිකයන්ට මේ රටෙන් පිටවීමට ඉඩ දෙන්න.. ඔවුන් වහා නිදහස් කරන මෙන් දෙවියන් වහන්සේ ඔබට අණ කර සිටිනවා
මොනවා.. නුඹලාට ඔප්පු කළ හැකිද ඔය කියන දෙවියන් වහන්සේ නුඹලාට කථා කළ බව.. නුඹලාගෙ දෙවියෝ මොන තරම් බලවත්ද කියලා පෙන්නපල්ලා...
හොඳයි රජතුමණි.. මේ.. ආරොන් අත තිබෙන ලී දණ්ඩ බිමට දැමූ විට එයට සිදුවන්නේ කුමක්ද කියා ...බලමු...

ළමා ප්‍රදීපය



උතුරේ ඔවුන්ගෙන් දකුණේ අපට උණුසුම් පිළිගැනීමක්



නොමිලේ පැවැත් වූ වෛද්‍ය සායනය



නායකකන්ද මීසම්වාසීන් තම නත්තල කැප කර ඔවුන්ගේ අත් තෑගිවලින් පිරවූහ



ද්‍රවිඩ ඔවුන්ට සිංහල අපෙන් ගැයුණු ද්‍රවිඩ කැරොල් ගීත



කුලම්ඉරුප්පු දෙව්මැදුර ඉදිකිරීමට නායකකන්ද මීසමෙන් සහාය

# නත්තල බෙදාගත් නායකකන්ද මීසම

නත්තල යනු අන් අය හා බෙදා ගන්නා මංගල්‍යයක් බව ප්‍රායෝගිකව පෙන්නූ නායකකන්ද මීසම් ජනතාව ලක්ෂ 40 ක පමණ පරිත්‍යාගයන් මුලතිව් කුලම්ඉරුප්පු ග්‍රාමයේ අසරණ ජනතාව හා මෙවර නත්තලේදී බෙදා ගන්නා ලදි. වෛද්‍ය සායනයක්, ක්‍රීඩා වැඩසටහන්, කැරෝල් හා නැටුම් අංග, සමග ඔවුන්ට නත්තල ගත කිරීමට දෝත පුරා කෑම බීම, ඇඳුම් පැළඳුම්, ගේ දොර උපකරණ ලබාදුන් නායකකන්ද මීසම මෙවර සියල්ලන්ටම සැබෑ ආදර්ශයකි.

සටහන/ ඡායාරූප : තිළිණ අලහකෝන්



නත්තල වෙනුවෙන් අපෙන් රසවත් ආහාර වේලක්



අප සිත් පිනවූ ඔවුන්ගේ දක්ෂතා



උතුරේ දරුවන් සමඟ ක්‍රීඩා කරමින්